# මගේ වැටුනු දත්



ආර්. එම්. බිමන්සා මුතුලි රත්නායක

3 ශ්‍රේණිය D

# මගේ වැටුනු දත්

චිත්‍ර සහ කතෘගේ නම - ආර්. එම්. ධිමන්සා මුතුලි රත්නායක

දිනය 10/12/2023

**ISBN 978-624-208-055-0**

# පිදුම

මගේ ආදරණීය දෙමාපියන්ටත් ගුරු මෑණිවරුන් හා පියවරුන්ටත්, සීයා, අත්තම්මා, මාමා හා නැන්දාටත්, මම ලියන අකුරු වල කුරුටුගාන මල්ලීටත් ආදරයෙන් මේ පොත පිරිනමමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඔන්න එක දවසක් මම මගේ පොත් පාට කර කර ඉද්දී මගේ හෙල්ලි හෙල්ලි තිබුණු දත කටට ආවා. ඉතින් මම අම්මට කිවුවා මොකක් හරි කටට ආවා කියලා. ඉතින් අම්මා බලද්දී ඒක මගේ දත. ඒ දතේ නම කෘන්තක.



ඔන්න දෙවෙනි දතත් ඒ වගේම එකක්. ඉතින් තුන්වෙනි දත මම මගේ ඇඟ සෝදනකොට ඒක මගේ ඇඳුමේ පැටලිලා. ඒකෙන් ගොඩක් ලේ ආවා. මම ගොඩක් බය වුනා, තාත්තා දත ගැලෙවුවා.





මගේ නම කෑන්තක


හතරවෙනි දත මම විස්කෝතුවක් කද්දී එකේ පැටළුනා. ඉතින් මට කන්න බැරුව බොහොම අමාරුවෙන් දවාලට කෑවේ. ඉතින් තාත්තා ඒකත් ගැලෙවුවා.



ඊට පස්සේ මගේ දත් ගොඩක් වැටුණා. මගේ කටේ දත් හැදිලා තියෙන්නේ විදුරුමසේ. මගේ කටේ කිරි දත් විස්සක් තියනවා කියල මම අහල තියනවා.



මගේ වයස හතේ ඉඳල කිරි දත් වැටිලා ස්ථිර දත් එනවා. මගේ වැටුණු දත් මම වහලෙට දාලා "ලේනෝ ලේනෝ මේ දත අරගෙන අළුත් දතක් මට දියෝ" කියල කියනවා.



මම අහල තියනවා රෑට දත කොට්ටේ යටින් තිබ්බම දත් සුරංගනාවී එනවා කියලා. එයා දත අරගෙන ගිහිල්ලා කාසියක් කොට්ටේ යට තියනවාලු.



එයා එනවද බලන්න දතක් වැටිච්ච දවසක මම කොට්ටේ යටින් දත තියලා මම බලාගෙන හිටියා.

ඒත් එයා ආවද කියලා මට හොයා ගන්න බැරි වුනානේ මට එහෙම්ම නින්ද ගිහින්නේ.



ඉතින් ඔහොම ගිහින් ස්ථිර දත් එනවා. ස්ථිර දත් තිස් දෙකක් තියනවාලු. අපේ කටේ හැමදාම තියෙන්නේ ස්ථිර දත්. ඉතින් අපි ඒවා පරිස්සම් කරගන්න ඕනේ.

ඒකට දවසට දෙවරක් දත් මදින්න ඕනේ. තව එකක් අපි පැණි රස කෑවාම කට සෝදන්න ඕනේ. පුංචි අපි හැමදාම අපේ දත් රැකගමු.

නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01